# වී අලෙවි මණ්ඩලය

## වී අලෙවි මණ්ඩලය සතු වී තොග විවෘත වෙළඳපොළේ අලෙවි කිරීම

වී අලෙවි මණ්ඩලය විසින් ගොවි ජනතාවගෙන් මිලදී ගෙන දැනට වී අලෙවි මණ්ඩලය සතු ගබඩාවල ගබඩා කර ඇති වී තොගවලින් මෙට්‍රික් ටොන් 100,000ක් විවෘත වෙළඳපොළේ අලෙවි කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, අදාළ වී තොග මිලදී ගැනීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙක් වෙත හෝ ආයතනයක් වෙත මේ සඳහා අවස්ථාව සලසා දෙනු ලැබේ.

වී තොග අලෙවි කිරීමේ විස්තර

- අලෙවි කරනු ලබන වී වර්ගය: සුදු නාඩු සහ රතු නාඩු
- අලෙවි කිරීමට අපේක්ෂිත මුළු වී ප්‍රමාණය: මෙට්‍රික් ටොන් 100,000
- **වී කිලෝග්‍රෑමයක මිල:** රු. 124.60
- වී නිකුත් කිරීම: ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අනුපිළිවෙළ අනුව, පවතින තොග සිමාවන්ට යටත්ව සිදු කරනු ලැබේ.

එක් එක් දිස්ත්‍රික්කයෙන් අලෙවි කිරීමට අපේක්ෂිත වී තොග ප්‍රමාණයන්, අදාළ ගබඩා පිහිටි දිස්ත්‍රික්ක සහ ඒ පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගත හැකි කලාප කාර්යාලවල විස්තර පහත දැක්වේ.

| කලාප කාර්යාලය | ලිපිනය සහ දුරකථන අංකය | ගබඩා පිහිටි දිස්ත්‍රික්ක | වී ප්‍රමාණය (කි.ග්‍රෑම්) | |
|---|---|---|---|---|
| | | | සුදු නාඩු | රතු නාඩු |
| අම්පාර | 063-2224870 | අම්පාර | 17,871,351 | 23,939,329 |
| | | මහනුවර | 671,110 | 11,590 |
| | | බදුල්ල | 474,247 | 31,110 |
| අනුරාධපුරය | 025-2222114 | අනුරාධපුරය | 15,192,063 | 476,921 |
| | | මාතලේ | 33,623 | - |
| උතුර | 021-2060913 | කිලිනොච්චිය | 831,095 | 982,960 |
| | | මුලතිව් | 569,239 | 4,154,693 |
| | | වව්නියාව | 711,982 | 6,286,233 |
| | | මන්නාරම | 291,485 | 1,426,859 |
| නැගෙනහිර | 026-2226691 | ත්‍රිකුණාමලය | 1,706,902 | 885,836 |
| පොලෙන්නරුව | 027-2222407 | පොලොන්නරුව | 2,460,901 | 585,040 |
| | | මඩකලපුව | 1,911,817 | 1,368,633 |
| | | මාතලේ | 1,414,596 | - |
| වයඹ | 037-2260628 | කුරුණෑගල | 194,500 | 329 |
| | | පුත්තලම | 1,085,930 | - |
| දකුණ | 047-2225514 | හම්බන්තොට | 7,242 | 6,564,569 |
| | | මොණරාගල | 703,483 | 3,365,340 |
| | | රත්නපුර | 87,860 | 2,763,161 |
| | | මාතර | 1,890 | 210,142 |
| මුළු එකතුව | | | **46,221,316.64** | **53,052,744.68** |

වී මිලදී ගැනීමට අපේක්ෂා කරන පාර්ශවයන් විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ කලාප කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය. වී තොග නිකුත් කිරීම ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අනුපිළිවෙළ අනුව සිදු කරනු ලබන බැවින්, උනන්දුවක් දක්වන පාර්ශවයන්ට කඩිනමින් අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙනු ලැබේ.

- අයදුම්පත් සහ සියලුම තොරතුරු කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියෙන් (https://agrimin.gov.lk) ලබා ගත හැක.
- වැඩිදුර තොරතුරු සඳහා අදාළ කලාප කාර්යාල හෝ වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය අමතන්න.

.....
සාමාන්‍යාධිකාරී
වී අලෙවි මණ්ඩලය

නිවාස මහලේකම් කාර්යාලය, 6 වන මහල, විත්තප්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02, (දු.අ.0112335411)